# ගම්වැව් හා බැඳි පවතින සමාජ වටපිටාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (ඇතාබැඳිවැව ගම්මානය ඇසුරෙන්)

ඒ.එස්.ඒ.එස්. ස්වර්ණවීර

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
sanduniemail78@gmail.com

**මුඛ්‍ය පද** - ගම්වැව්, සමාජය, සංස්කෘතිය, කෘෂිකර්මාන්තය, වාරි තාක්ෂණය

## හැඳින්වීම

පැරැණ්නන් විසින් එකල ශ්‍රී ලංකාද්වීපය හැඳින්වූයේ වැව් බැඳි රාජ්‍ය යන නමිනි. එයට හේතු වූයේ මෙහි ඇති වාරි කර්මාන්තයේ ස්වාභවයයි. 19 වන සියවසේ අවසාන භාගයේ දී භූමි ප්‍රමාණයක මිනුම්කරුවන් විසින් සොයා ගෙන ඇති පරිදි දිවයිනේ ගිණිකොණ දිග ප්‍රදේශයෙහි සතරැස් 1500 ක භූමි ප්‍රමාණයක හරි හතරැස් සැතපුමකට ම වැවක් තිබූ බව සොයා ගෙන ඇත (ගුණවර්ධන, 2016). ඒ අනුව පැරණි ශිෂ්ටාචාර ගොඩනැගිමට මෙන්ම ගමක් සංවිධානය වීම මෙවැනි ගම් වැව් ආශ්‍රිත කොට ගත් බව පැහැදිලි කරුණකි. අහස් ජලය අවුරුද්ද පුරා නොලැබුණ නිසා වැව් තනා ජලය එක්රැස්කොට තම දෛනික අවශ්‍යතා ඉටු කර ගැනිමට ගැමියා පුරුදුව සිටි බව සිතිය හැක. බොහෝ විට වියළි කලාපය ආශ්‍රිත කොට ගෙන වැව් ජනාවාස ගොඩනගා ගෙන ඇති බව ශ්‍රී ලංකාවේ පැරණි වාරි කර්මාන්තය කෙරෙහි අවදානය යොමු කිරිමේ දී පැහැදිලි වේ. බොහෝ විට ගැමි ජන ජිවිතය ඈත අතීතයේ සිටම වැව වටා ගෙතුණි. වැව හා ගම යන වචන දෙක එකිනෙකට බද්ද වූ වචන දෙකකි. බොහෝ අවස්ථාවල ග්‍රාම නාම යෙදි ඇත්තේ වැව යන වචනය සම්බන්ධ කොට ගෙනය. වියළි කලාපයක් වන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුඩා ග්‍රාම රාශියක් ම ග්‍රාම නාමයන් වැව යන වචනය මූලික කොට ගෙන ගොඩනැගි තිබේ. ඇතාබැදිවැව ඉන් එකක් ලෙස හඳුනාගත හැක. ඇතාබැඳිවැව ගම්මානය ආශ්‍රය කොටගෙන ගම් ආශ්‍රිත බැඳි සමාජ වටපිටාව පිළිබඳ අධ්‍යයනය සිදු විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වශයෙන් ගම්වැව් ආශ්‍රිත බැඳි සමාජ වටපිටාව කෙබඳු ද යන්න සොයා බැලීමක් වූ අතර එකී අරමුණ සාක්ෂාත් කර කරනු උදෙසා ඇතාබැඳිවැව ගම්මානය ආශ්‍රිත ගම් වැව් පද්ධතිය සමාජය සමඟ බද්ධ වී එය සංවර්ධනයට පිටුවහලක් වන්නේ ද යන පර්යේෂණ ගැටළුව ඔස්සේ පර්යේෂණ සිදු කරන ලදී.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගැනීමේ දී සාහිත්‍යයමය මූලාශ්‍ර අධ්‍යයනය මඟින් තොරතුරු ලබා ගන්නා ලදි. එම තොරතුරුවලට අමතරව ඇතැබැදිවැව ගම්මානයේ වාසය කරන වයසින් වැඩි පුද්ගලයන් සමඟ කළ සම්මුඛ සාකච්ජාගත තොරතුරු ද ඇතුළත් කරගන්නා ලදි.

## ප්‍රතිඵල හා සාකච්ජාව

ගම්වැව් සංකල්පය උපයෝගී කොටගෙන වසභ රාජ්‍ය (ක්‍රි.ව. 114-136) සමයේ දී ජාලගත තිරස් වැව් පද්ධතියට අනුව නිර්මාණය වූ වැව් කිහිපයක එකතුවක් ඇතාබැඳිවැව ගම්මානය ආශ්‍රිත කොට ගෙන ඇති බව පැහැදිලි ය. ඇතාබැඳිවැව මහවැව, කුඩාවැව, පැණිකැටියාව වැව, කඳුරුවැව, නයිදාවිරිවැව, වලස්වැව, ඉහලවැව, කඩවත වැව මේ සියලු ගම්වැව් ඇතාබැඳිවැව ගම්මානය වටා ඇති අතර කුඹුරු අක්කර 1500-2000 කට පමණ අවශ්‍යය ජල ධාරිතාවයක් සපයයි. ඇතාබැඳිවැව ගම්මානයේ ජනයා වැව් ජලය උපයෝගී කොටගෙන කෘෂිකර්මාන්තය මූලික කොටගත් ආර්ථික රටාවක් පවත්වාගෙන යන ලදි. ඒ අනුව මොවුන් වැව් ජලය ලබා ගනිමින් තම වගා කටයුතුවල නිරත වූ බවට සම්මුඛ සාකච්ඡා මඟින් තවදුරටත් හෙළි වී ඇත. මාළු ලබා ගනිමින් හා ආහාර අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනිමට

ද ගැමියා ක්‍රියාකර තිබෙන්නා මෙන්ම රැකියාවක් ලෙස ධීවර කටයුතුවල නිරත වීමට ද අතිතයේ මෙන්ම වර්තමානයේ ද ගැමියා පුරුදු ව සිටී. වැව් ආශ්‍රිත බැඳුණු සමාජ පරිසරය සංස්කෘතිය විමසා බැලීමේ දී වියළි කලාපීය ජන සමාජයක් ගොඩනැගීමෙහි ලා විවිධ චාරිත්‍ර වාරිත්‍ර හා බැඳී ඇති බව දක්නට ලැබුණි. ඒ අතරින් අලුත් සහල් මංගල්‍යයට ප්‍රධාන තැනක් හිමි වේ. යල කන්නය හා මහ කන්නය යන කන්න දෙකම අස්වනු නෙළා අවසන් කොට ඒවා පරිභෝජනය කිරීමට ප්‍රථම අලුත් සහල් මංගල්‍යය කපුරාලගේ මඟපෙන්වීම මත සියලුම චාරිත්‍ර වාරිත්‍ර ගණ දෙවියන්ට හා වන්නි දෙවියන් මත සිදුකර අවසානයේ ගමේ සෑම දෙනා එක්ව කිරිබත් හා ආහාර වේලක් සකස් කර එම ආහාර වේල දේවාල භූමියේ බිම වාඩි වී නෙළුම් කොළ හා කෙසෙල් කොළ දමා අනුභව කරති. එය දේව දානය නමින් හැඳින්වෙනු ලැබේ. මෙහි සංවිධාන කටයුතු සඳහා මූලිකත්වය ගනු ලබන්නේ වෙල් විදානේ හා ගමේ පැරණිතම ගැමියන් පිරිසයි. ගොවිතැන් කිරීම ආරම්භ කිරීමට පළමුව ගණ දෙවියන් උදෙසා භාර වන අතර ගොවිතැන් කටයුතු අවසන් කොට පරිභෝජනයට ප්‍රථමයෙන් ම අස්වනු කොටස් එකතු කර ගණදෙවියන් වෙනුවෙන් වූ භාරයක් ඔප්පු කරනු ලැබේ. ඒ සඳහා කිරි ඉතිරවීම සිදුකරයි. ඇතැම් ගැමියන් තමන් වගා කරනු ලබන ඉඩමේ මේ පුජාව සිදු කරයි. සාර්ථක අස්වැන්නක් ලබා ගැනිම සඳහා තම කෘෂි බෝග ලෙඩරෝගවලින් ආරක්ෂා වීම, සතුන්ගෙන් හා සතුරු උපද්‍රවවලින් ආරක්ෂා කිරීම පිළිබඳ සියළු දෙවියන්ට කෘත ගුණ සැලකිම වෙනුවෙන් මෙම පූජාව කරන බව ගැමියන්ගේ අදහස්වලින් හැගුණි. වාරිමාර්ගය තුළින් බිහි වූ ජීවන වෘත්තීන් පිළිබඳ පැහැදිලි කිරීමේ දී වෙල්විදාන තනතුරු ප්‍රධාන වේ. අතීතයේ නම් සෑම ගෙදරකින් ම අස්වනු ලබාගත් පසු වී බුසල් ප්‍රමාණයක් ලබා දිය යුතු වේ. නමුත් වර්තමානය වන විට එය මුදල් බවට පත්වී ඇති අතර එය ගොවි සංවිධානයේ මූලිකත්වයෙන් ගෙවනු ලැබේ. මෙම වෙල් විදාන තනතුර පරම්පරාවෙන් පරම්පරාවට පැවතගෙන ආ නමුත් වර්තමානයේ යම් යම් වෙනසකට ලක් වී එය ගොවි සංවිධාන මූලිකත්වය ගෙන කටයුතු කරන බවක් දැකගන්නට ලැබුණි. වැව හා ගොවිතැන් කටයුතු ආශ්‍රිත සියළු තීරණ බොහෝ විට වෙල්විදානේ විසින් ගනු ලැබීම එම තනතුරේ විශේෂත්වයයි.

ඈත අතිතයේ පටන් ගම්වැව් ඉදි වී තිබු අතර ඇතාබැදිවැව ගම්මානය පුරා දක්නට ඇති එවැනි ගම් වැව් පද්ධතිය මෑත කාලීනව ද මානව ප්‍රයෝජනයට ගන්නා අතර සමාජය වැව් සමඟ බද්ධ වෙමින් මානව ජීවිතයට රුකුලක් ලබා දේ. මෙම ගම්මාන පුරා වන ගම් වැව් මඟින් දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික යන සමාජයේ සෑම අංශයක් කෙරෙහි ම යම් යම් බලපෑම් ඇති කරන අතර එකී තොරතුරු විමර්ශනය මඟින් ඇතැබැදිවැව ගම්මානය ආශ්‍රිත සමාජමය හැඩගැසීමට මහත් සේ උපයෝගී වී ඇති බව පැහැදිලි වේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**


බස්නායක, එච්.ටී, (1997), ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ගුණවර්ධන, පී. (2004), ***පුරාණ ගම මානව වංශ පුරාවිද්‍යා විමර්ශනය***, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

තෙන්නකෝන්, එම්.යු.ඒ. (2012), ***එල්ලංගානුගත වැව්වලට ප්‍රවේශයක්,*** ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.